# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13**
**2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි**
**(නව / පැරණි නිර්දේශය)**
**සමාජීය විද්‍යා පීඨය**

**ඉතිහාසය - HIST - E 1015**

**පැරණි ශිෂ්ටාචාර**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. i) 'ශිෂ්ටාචාරය' යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
    ii) ශිෂ්ටාචාරවල දැකිය හැකි පොදු ලක්ෂණ විස්තර කරන්න.

02. ආදි පාෂාණ හා නව පාෂාණ යුග පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

03. සුමේරියානු ශිෂ්ටාචාරය බිහිවීමට තුඩුදුන් භූගෝලීය සාධක පරීක්ෂා කරන්න.

04. පුරාණ බැබිලෝනියානු සමාජය පිළිබඳ හැදෑරීමෙහිලා හමුරාබි නීති සංග්‍රහයේ ඇති වැදගත්කම පරීක්ෂා කරන්න.

05. පුරාණ ඊජිප්තු පාලකයන් අතර පැවති 'දේව සම්භවය' පිළිබඳ විශ්වාසය එම ශිෂ්ටාචාරය හැඩගැස්වීමෙහිලා බල පෑ අයුරු පැහැදිලි කරන්න.

06. පහත සඳහන් මාතෘකාවල ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
    i) මිනෝවන් ශිෂ්ටාචාරය
    ii) ෂං රාජවංශ යුගය

07. i) ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමය සැකෙවින් පැහැදිලි කරන්න.
    ii) එම පෞර රාජ්‍යවල ප්‍රචලිතව පැවති ආණ්ඩුක්‍රමවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

08. ග්‍රීක සංස්කෘතිය හා සම්බන්ධ පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
    i) ග්‍රීක ආගම
    ii) ග්‍රීක සාහිත්‍ය
    iii) ග්‍රීක දර්ශනය

09. රෝම අධිරාජ්‍යය තුළ ක්‍රිස්තියානි ආගම පැතිරියාමේ ප්‍රධාන අවස්ථා පැහැදිලි කොට, රෝමවරුන් විසින් ක්‍රිස්තියානිය පිළිගනු ලැබීමේ වැදගත්කම පරීක්ෂා කරන්න.

10. බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීමට තුඩුදුන් ප්‍රධාන සාධක සාකච්ඡා කරන්න.

*****************************